# ලෝක බැංකු දේශපාලනය

මේ සතියේ අපට ඔබේ සමාජ විද්‍යාවෙන් බැහැරවීමට සිදුවෙයි. ඒ ලෝක බැංකුවේ මෙරට නියෝජිතයාවන පීටර් හැරල්ඩ් මහතාගේ ප්‍රකාශයක් හේතුකොටගෙන ය. ඒ ප්‍රකාශය පළමුවෙන් පළවුයේ පසුගිය ඉරිදා සන්ඩේ ටයිම්ස් පුවත්පතෙහි ය. හැරල්ඩ් මහතා ඒ පුවත්පතට කියා තිබු දෙයින් 'කොටි සංවිධානය මෙරට උතුරු හා නැගෙනහිර පළාත් පාලනයකරන සංවිධානය බව ඒ වචනවලින් ම නොවුවත් ගම්‍යවන අයුරින් කියයි. ලෝක බැංකු නියෝජිතයා කර ඇත්තේ ත්‍රස්තවාදී සංවිධානයක් නීත්‍යානුකුල කිරීම පමණක් නො වෙයි. ඔහු ඊළාම ද නීත්‍යානුකුලකිරීමට අනියමින් කටයුතුකරයි.

මොහුගේ මේ ප්‍රකාශය පිළිබඳව දැනටමත් සංවිධාන හා දේශපාලන පක්ෂ රාශියක් විරෝධය පළකර ඇත. එහෙත් රටෙහි ජනාධිපතිනිය ඒ පිළිබඳ නිහඬවෙයි. ඇය විසින් කළයුතුව තිබුණේ හැරල්ඩ් මහතා වහාම රටින් පිටුවහල්කිරීම ය. එහෙත් ඇයට ඒ සඳහා ශක්තියක් නැත. ලෝක බැඅකුවෙන් හිඟමනේ යෑම තම ප්‍රධාන කාර්යය කරගෙන ඇති ලංකාණ්ඩුවට හැරල්ඩ් මහතාට ආපහු යෑමට කීමට තරම් ශක්තියක් නො තිබීම පුදුමයක් නො වෙයි.

ලෝක බැංකුවේ නියෝජිතයා කර ඇති ප්‍රකාශය රටේ ස්වෛරීභාවයට මහත් තර්ජනයක් වෙයි. එහෙත් අවාසනාවකට මෙරටට ස්වෛරීභාවයක් තිබේ ද යන්න ප්‍රශ්නයක් වෙයි. අද මෙරටේ කටයුතුවලට ඇඟිලි නොගහන සුද්දා කවුද? සුද්දෝ එති. සුද්දෝ යති. ඔවුහු හරසරින් පිළිගැනෙති. ඔවුහු මෙරට දී ද පිටරට දී ද ප්‍රකාශකරති. මෙරට වැඩ සිදුවිය යුත්තේ මෙසේ යැයි අපට කියාදෙති. එහෙත් අප කරන්නේ කුමක් ද? නිකම් බලාගෙන සිටීම පමණ ය. අපට ණය නොලැබේය යන බියෙන් අපි කටවසාගෙන සිටිමු. සිංහල යැයි කියාගන්නා නායක නායිකාවන් මෙතරම් නිවට වූ අවධියක් අප රටේ ඉතිහාසයෙහි තවත් තිබී ද යන ප්‍රශ්නය ඇසීමට සිදු වී ඇත.

ණය ලබාගැනීම හැරෙන්නට වෙනත් සංවර්ධනයක්  නොදන්නා නායක නායිකාවෝ රට වුව ද විකුණා බලය රැකගැනීමට උත්සාහකරති. ඔවුන්ට අද සුද්දන්ගේ සරණ හැරෙන්නට අන් සරණක් නැත. ණය ඔස්සේ ලැබෙන කොමිස් මුදල් ගැන ද දන්නෝ දනිති. ඊනියා තුන්වැනි ලෝකය යැයි කියන රටවල නායක නායිකාවන්ගේ මෙන් ම නිලධාරීන්ගේ ද ගති ස්වභාවය සුද්දෝ දනිති.

එන්න එන්න ම බටහිරයන් විසින් කෙරෙන බලපෑම් වැඩිවෙයි. සොල්හයිම් මෙරට නිත්‍ය පදිංචිකරුවකු මෙන් කටයුතු කරනු දැකිය හැකි ය. ඔහු මෙවර තම පුත්‍රයා ද සමග පැමිණියේ ය.  මල්වතු අස්ගිරි මහානායක හිමිවරුන් බැහැ දැක අටපිරිකර ද පිරිනැමී ය. ඇමරිකන් ජනාධිපතිවරු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්, තවත් නිලධාරීහු, වෙනත් රටවල නායකයෝ සුනාමියෙන් මෙරටට ගොඩගසාගෙන පැමිණියෝ ය. කොෆී අන්නන් මහතා උතුරට හා නැගෙනහිරට යැවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොළඹ නියෝජිතයෝ විශේෂ වෙහෙසක් දැරූහ. ඔහුට ඒ පළාත්වලට යෑමට ඉඩනුදුන් විට මේ නියෝජිතයෝ කණස්සල්ලට පත්වූහ.

ලෝක බැංකුවේ නිලධාරියා රටේ ස්වෛරීභාවය කෙළෙසා ප්‍රකාශයක් කිරීමට මත්තෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයෝ ප්‍රකාශ නිකුත්කළහ. කෞශල්‍යයන් මියගිය අවස්ථාවේ කොෆි අන්නන් ලවා ශෝක ප්‍රකාශ නිකුත්කිරීමට කටයුතු කළෝ කවරහු ද? ඔවුන්ට හෝ ලෝක බිංකුවේ ලංකා නියෝජිතයාට හෝ එරෙහිව ඒ ඒ සංවිධාන ගන්නා පියවර කුමක් ද? මොවුන් මේ ප්‍රකාශකරන්නේ වෙනත් බලවතුන්ගේ අනුමැතියෙන් තොරව ද?

අද බටහිරයන් වෙනදා හැංගි හැංගි කළ දේ එළිපිට ම කරනු දක්නට හැකි ය. එයට හේතුවක් ඇත. ඊළම දීම තව තවත් ප්‍රමාදකිරීමට ඔවුන්ට නො හැකි ය. එයට ප්‍රධානම හේතුව අද කොටි සංවිධානය ඉතාමත් දුර්වල සංවිධානයක් වීම ය. අද කොටින්ට කළහැකි යුද්ධයක් නැත. කොටි සංවිධානය ම අඩුම තරමින් කොටස් තුනකට කැඩී ඇත. තමිල්සෙල්වන් හා ඇන්ටන් බාලසිංහම් දේශපාලන නායකත්වයෙහි ය. සුසෙයි එක් පැත්තක නායකයා වෙයි. ඒ අතර කරුණා වෙයි. කරුණා කියන අන්දමට ප්‍රභාකරන් අද ජීවතුන් අතර නැත. මෙවැනි තත්ත්වයක් යටතේ බටහිරයන්ට ඉවසීමක් නැතිවීම පුදුමයක් නො වෙයි.

© Prof. Nalin De Silva

ලෝක බැංකුවේ ලෝකයා කියන අන්දමට කොටි සංවිධානයට උතුරු හා නැගෙනහිර පළාත්වල මහා බලයක් ඇත්නම් කෞශල්‍යයන් හා වෙනත් නායකයන් මැස්සන් සේ මැරී යන්නේ කෙසේ ද? ඉද නැගෙනහිර පළාතේ බලය ඇත්තේ කාටදැයි ලෝක බැංකුවට කරුණාගෙන් දැනගැනීමට හැකි ය. මෙහි දී බලය යැයි මා සඳහන්කරන්නේ කොටි සංවිධානයට සාපේක්ෂ අර්ථයකින් මිස රාජ්‍ය අර්ථයකින් නො වෙයි. තමන්ට බලය ඇතැයි කියන ප්‍රදේශවල දී මැස්සන් සේ මියයන නායකයන් ඇති කොටි සංවිධානයට බලය පැවරීමට බටහිරයෝ කතාකරති.

බටහිරයන්ගේ මේ භයානක විහිළුව නැවැත්වීමට නම් කළයුත්තේ කොටි සංවිධානයට මේ අවස්ථාවේ දී එළව එළවා පහර දීම ය. එහෙත් ලංකාණ්ඩුව කුමාරතුංග මහත්මිය ජනාධිපතිනිය ව සිටිනතාක් එවැනි පියවරක් නොගනු ඇත.ඇයට උරුම වී ඇත්තේ ඇගේ සීයලාගේ ක්‍රිස්තියානි සංස්කෘතිය මිස සිංහල බෞද්ධ සංස්කෘතිය නො වෙයි. එසේම ඇයට ඇගේ කතෝලික සැමියාගේ සිංහල බෞද්ධ විරෝධී දේශපාලනය ද උරුම වී ඇත. ඇය තැන නොතැන නොබලා සිංහල බෞද්ධයනට පහර දෙයි. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට ද ගිය ඇය එහි දී ද සිංහල බෞද්ධයනට පහරදීමට අමතක නො කළා ය. අප කලින් ද කියා ඇති පරිදි ඇගෙන් මෙරටට සිදු වී ඇති එකම සේවය රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති පදවියට පත්වීම වැළැක්වීම පමණකි.

කුමාරතුංග මහත්මිය ජනාධිපතිවරිය ලෙස සිටිනතාක් කොටි සංවිධානය පරාජයකිරීමට නො හැකි ය. ඉතා ලෙහෙසියෙන් පරාජය කිරීමට තිබු කොටි සංවිධානට තවත් ජීවිතයක් ලබාදීම පිළිබඳ ව ඇය වගකිව යුතු ය. ඇය නිතරම බලය බෙදීමක් ගැන කතාකරයි. සිංහල ජනයාගෙන් අහවල් ප්‍රතිශතයක් බලය බෙදීමට කැමති යැයි ඇය පවසයි. සිංහල ජනතාව යනු ඇගේ එතරම් දක්ෂ නැති මිතුරු මිතුරියන්ගෙන් සමන්විත කල්ලියක් යැයි ඇය සිතා සිටිනවා වියහැකි ය.

ඇය කතාකරන ෆෙඩරල් විසඳුම ගැන ද වචනයක් කිවයුතු ය. අද ලංකාවේ දෙමළ ජනයා උතුරු හා නැගෙනහිර පළාත්වල බහුතරයවත් දෙමළ ජනයාගෙන් බහුතරය ඒ පළාත්වල ජීවත්වනවාත් නො වෙයි. අප බොහෝ කලක සිට පෙන්වා දී ඇති පරිදි ිමෙළ ජනයාගෙන් 60%ටත් වැඩි ප්‍රමාණයක් ජීවත්වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්න විසඳීමට උතුරු හා නැගෙනහිර පළාත්වලට හා අනෙක් පළාත්වලට ෆෙඩරල් රාජ්‍යයක් ලබාදුනහොත් අනෙක් පළාත්වල සිටින දෙමළ ජනයාට ඇතැයි කීයන ප්‍රශ්න ඒ සන්ධීය විසඳුමෙන් විසඳන්නේ කෙසේ ද? ප්‍රශ්නයක් ඇතැයි කියා ඒ විසඳීමට යැයි කියන විසඳුමකින් ඒ ඇතැයි කියන ප්‍රශ්නය නො විසඳෙන්නේ නම් ඊනියා විසඳුමෙන් ඇති වැඩය කුමක් ද?

ප්‍රශ්නය ම බොරුවක් වූ කල විසඳුම් දෙන්නේ කෙසේ ද? ප්‍රශ්නයේ මුල බටහිරයන් ඇත. අප ලෝක බැංකුකාරයාගේ ප්‍රකාශය ගැන කතාකළ යුත්තේ ඒ පදනමින් ය. ලෝක බැංකු නියෝජිතයා තම වුමනාවට පමණක් එවැනි භාරදූර ප්‍රකාශයක් නිකුත් නො කරයි. ‍_එක්සත් ජාතින්ගේ සංවිධානයේ නියෝජිතයෝ හිතුමනාපයට කටයුතු නො කරති. මේ සංවිධාන යනු අවසාන විග්‍රහයේ දී ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල අවශ්‍යතාව අනුව ක්‍රියාත්මක වන රටවල් වෙයි. අද ඇමරිකා එක්සත් ජනපදය යනු ජගත් අධිරාජ්‍යවාදයේ නැත්නම් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයේ නියමුවා වෙයි. කලකට පෙර බ්‍රිතානිය කළ දේ අද ඇමරිකා එක්සත් ජනපදය කරයි. කුමාරතුංග මහත්මියගේ ක්‍රිස්තියානි මහමුදලි සීයා හා කතෝලික සැමියාගේ දේශපාලනයට නො තේරුණ ද මෙරට දෙමළ ජාතිවාදය ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා ඉන්දියාවෙන් දෙමළ ජනයා ගෙන ඒමෙන් ඇරඹිණි. බ්‍රිතානීහු එය වැඩි දියුණු කළහ. ංද ඇමරිකා එක්සත් ජනපදය එය තවදුරටත් ගෙනයයි. දෙමළ භාතිවාදය සිංහල බෞද්ධත්වයට එරෙහිව උස්සා තබන්නේ බටහිරයන් විසිනි. එයට බටහිර රාජ්‍ය ද ඇතුළත් වෙයි. එය හුදෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හෝ ලෝක බැංකුවේ හෝ ඉන්නා මගඩියකුගේ වැඩක් නො වෙයි. දෙමළ ජාතිවාදය යනු බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ නිපැයුමක් ලෙස නො දැක ලෝක බැංකුකාරයාගේ ප්‍රකාශය අවබෝධ කරගත නොහැකි ය. ලෝක බැංකු නියෝජිතයා යනු බටහිර සංස්කෘතික ආර්ථික හා දේශපාලන යටත්විජිතවාදයෙහි තවත් නියෝජිතයෙක් පමණක් වෙයි.

© Prof. Nalin De Silva